# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2446/27 – 2025 ජුලි මස 21 වැනි සඳුදා – 2025.07.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/15.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

බී.කුලතුංග ආරච්චි මහත්මිය, අංක.76, රාහුල පාර, අංගොඩ

සහ

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය,අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර,නාගොඩ,

ශ්‍රී සෝභිත මාවත, අංක 242 නිතීඥ ඕබඩගේ ලීලාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/15.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

බී.කුලතුංග ආරච්චි මහත්මිය, අංක.76, රාහුල පාර, අංගොඩ

සහ

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය,අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නිලධාරී IV තනතුරේ සේවය කරන බී.කුලතුංග ආරච්චි මහත්මියට, නිලධාරී IV තනතුරේ සිට නිලධාරී III (සහකාර කලමනාකාර) තනතුරට උසස්වීම් ලබා ගැනීම සඳහා වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළයුතු බවට වන කොන්දේසිය පැනවීම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම්, ඇයට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.”

**එච්. එම්. ඩී. එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0243

---

මගේ අංකය: IR/COM/03/2023/171.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය, අංක 12/01, දූවන පල්ලිය පාර, උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ.

සහ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර,කොළඹ 05

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, අංක 10/51 නීතිඥ වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/171.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය, අංක 12/01, දූවන පල්ලිය පාර, උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරකු ලෙස සේවය කරන පී. බන්දුල පත්මකීර්ති ද අල්විස් මහතාට එරෙහිව 2021.08.18 දිනැතිව ආරම්භ කරන ලද විනය පරීක්ෂණය මගින් ලබා දී ඇති විනය නියෝග හේතුවෙන් ඒ මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ..”

**එච්. එම්. ඩී. එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.